# මගේ පොඩි මල්ලියේ - මේ ඔබේ සදාදර

## පුංචි අක්කා පුදන - උපහාර ගීතය

බාල වියේ සිට සෙනෙහස - පිදූවා මගෙ මලයා
විදුනැණ බල සියල්ල දත් - විදූ සක්විති මලයා
යන එන තැන සෙවනැල්ලක් - වී සිටිනා මලයා
තෙරුවන් සරණේ බලයෙන් - රැකදෙන් මගෙ මලයා

විස්කම් දස්කම් කරමින් - අත්වැල වූ මලයා
කැඩුණු බිඳුණු සියලුදේම - සැකසූ මගෙ මලයා
කතාව අඩු-වැඩ අඩු නැති - මාගේ පොඩි මලයා
තිස්තුන් කෝටියක් දෙවිඳු - රැකදෙන් මගෙ මලයා

වැඩක් කරනවිට ගීපද - මුමුණන මගෙ මලයා
සැහැල්ලුවෙන් විනෝදයෙන් - සිටිනා පොඩි මලයා
විකට කතා රස කර-කර - කියනා මගෙ මලයා
මගේ ආයුෂත් අරගෙන - සුරැකෙන් මගෙ මලයා

මිතුරන් අතරේ සැමදා ‘පෙට්ටා’ වුණ මලයා
සැම වැඩකදි ‘සෙට්ටා’ වී වැජඹුනෙ මේ මලයා
පිය උරුමෙන් ලද නුවණින් පැණ විසඳූ මලයා
නිදුක්-නිරෝ සුවලැබගෙන වැජඹෙන් මගෙ මලයා

නැදෑ හිත මිතුරන්හට - නැතුවම බැරි මලයා
යන්ත්‍ර-සූත්තර හැමදේ - දැනසිටි පොඩි මලයා
ඉවසීමෙන් සැනසීමෙන් - කල ගෙවනා මලයා
පවුලේ ‘මිණි පහන’ ඔබයි දන්නවාද? මලයා

විදු නැණ පිරි විශ්වකෝෂයක් වන් මගෙ මලයා
ගණිත ගැටලු විසඳාලන - නුවණ ලැබූ මලයා
‘ගණ දෙවියන්’ පිහිට ලබා උපත ලැබූ මලයා
ලෝ සතහට ඔබෙ නුවණින් - සෙතවේවා මලයා

හැන්දෑවේ ‘හය’ වනවිට - දැහැන්ගතව ඉඳලා
‘පරිගණකය’ තුරුළු කරන් - ලෝකෙ වටේ දුවලා
රෑ යාමේ ගන අඳුරේ - තරු ගණිමින් ඉඳලා
‘විශ්ව සමාධිය’ පුරමින් - උඩු ගුවනේ දුවලා

උදේ ‘හතට’ දුව පස්සෙන් - පාර ළඟට යන්නේ
අට වනවිට ‘පුතා ගියා’ - ශේට්ටු හඬ එන්නේ
කතා නැතිව දිවා කලේ - ‘බිරියව’ සුරකින්නේ
ඉඳහිටලා ‘පුංචි අක්කෙ’ - කියනා හඬ එන්නේ

පාරමිතා පුරමින් බණ කතා අසන දැහැනේ
ඉඳහිටලා වත්තපුරා එහෙමෙහෙ යන ගමනේ
දසුන දකින විට මට මගෙ පියාගෙ රුව පෙනුනේ
සිහිවනවා මල්ලියෙ මට අතීත පුර වරුණේ

මගෙ දිවියට නැතුවම බැරි මගේ එකම මලයා
මහමෙර සේ නොසැලෙන ගුණකඳ ඇති පොඩි මලයා
සත්සුන් ලෙස බෝසත් ගුණ පෙන්නූ මගෙ මලයා
සංසාරේ හැම වාරේ - හමුවේවා! මලයා

කලයාණි සෙනරත් යාපා
හිඹුටාන
2019-ජූනි 14